# Guzz පූසාගේ අපූරු චාරිකාව



නදෙව්නි ටමාෂා විජේසුන්දර



# Guzz පූසාගේ අපූරු චාරිකාව

නදෙව්නි ටමාෂා විජේසුන්දර

**ISBN - 978-624-206-765-0**

කෘතිය පළ කරන දිනය - **15.11.2023**

කතෘගේ වෙනත් කෘති - අපූරු තෑග්ග

රජතුමාගේ උපාය

එලීනා සහ රියානා

පූසාගේ බඩරිදිල්ල

**Liza's Dream**

## පිදුම

මෙම කෘතිය ලිවීමට මට උදව් උපකාර කළ

මගේ ආදරණීය

අප්පච්චීට, අම්මාට, ලොකුඅම්මාට,

අත්තාට, අත්තම්මාට සහ

චූටි නංගීටත්,

නිරතුරුවම මා දිරිමත් කරමින් යහමඟ පෙන්වන

ආදරණීය සමන්මලී ගුරුතුමියටත්

ඉතා සෙනෙහසින් හා ගෞරවයෙන් පුදමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥා සම්පන්න දැනුමෙන් යුත් බහු විධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොට ගෙන ග්‍රන්ථ කරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩ නැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත් කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතු වන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ 'දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක් වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරු භවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධිර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

**2023.11. 01**

# Guzz පූසාගේ අපූරු චාරිකාව

ඔන්න එක ගෙදරක හුරතලේට ඇති කරන ලස්සන පූස් පැටියෙක් හිටියා. එයාගේ නම **Guzz.** එයා සුදු හා අළු පාට මිශ්‍ර වුණු දිග ලොම් ගොඩක් තියන පුළුන් බෝලයක් වගේ ලස්සනම ලස්සන පූස් පැටියෙක්. පැටියෙක් කිව්වට එය වෙන පූසන්ට වඩා ප්‍රමාණයෙන් ටිකක් ලොකුයි. එයාගේ නහය ළඟ කළු පාටයි, ඇඟ සුදු පාටයි, ඇස් දෙක නිල් පාටයි, වලිගය ලොකු බුරුසුවක් වගෙයි. හැබැයි එයාගේ ලස්සන නිසාම එයා ටිකක් ආඩම්බරයි.



එයා හිටිය ගෙදර හැමෝම එයාට හුඟක් ආදරය කළා. සෙල්ලම් කළා. රස කෑම බීම දුන්නා. පරිස්සමින් රැකබලා ගත්තා. ඒ අතරෙ දවසක් **Guzz** ට පොඩි දඟ වැඩක් කරන්න හිතුණා.

"මෙහෙ හැමෝම මට ආදරෙයි තමයි, ඒත් මෙහෙ මට හරිම කම්මැලියි. යන්න ඕනේ නගරයේ වෙන්නේ මොනවද කියලා බලන්න. එහේ බලන්න ගොඩක් දේවල් තියෙනවලු."

එහෙම හිතුව **Guzz** නගරයේ ප්‍රසිද්ධ ඉස්කෝලෙක ගුරුතුමියක් වුණ එයාගේ අයිතිකාරිය ඉස්කෝලේ යන වෙලාවක් බලලා හොරෙන් ගෙදර වාහනේට නැගලා හැංගුණා. ඉතින් වාහනය ඉස්කෝලෙට ඇවිත් නතර කළාට පස්සේ හොරෙන් වාහනෙන් බැහැලා වටපිට බලමින් ඉස්කෝලෙ පුරාම ඇවිද්දා. ඒ

අතරේ Guzz ව දැක්ක ඉස්කෝලේ පිරිමි ළමයින් දෙන්නෙක් Guzzව ඉස්කෝලේ විදුහල්පතිතුමා ළඟට අරන් ගියා. ඒත් එයාලා කතා කරන අතරේ නගරයේ ලස්සන බලන්න ආසාවෙන් හිටිය Guzz හිමීට එතනින් පැනලා නගරය බලන්න ගියා.

ඒත් නගරය එයා හිතපු තරම් සාමකාමී වුණේ නෑ. වාහන ගොඩක් නලා ශබ්ද කරමින් පාරේ ගියා. මිනිස්සු කලබලයෙන් පාරේ එහේ මෙහේ ගියා. එයාට ආපහු යන්න හිතුනත් ආපු පාර හොයාගන්න බැරි වුණා. Guzz ඒ කලබල නගරයේ අතරමං වුණා.



හොඳටම බයවුණු **Guzz** පාරේ එහෙ මෙහේ ඇවිද්දා. එයාට හොඳටම බඩගිනි වුණත් කන්න මොනවත් හොයාගන්න බැරි වුණා. මේ විදිහට **Guzz** බඩගින්නෙන්, බයෙන් හා දුකෙන් දවස් දෙකක් විතර ගොඩක් දුර ඇවිද්දා.

දවසක් **Guzz** වාහනේකටත් හැප්පෙන්න ගියා. එයා කොහොමහරි කාණුවකට පැනලා බේරුණා. එදා රෑ එයා ලොකු ගොඩනැගිල්ලක් දැකලා ඒක ඇතුළට ගියා. එයාගේ වාසනාවට එයා ගිහින් තිබුණේ නගරයේ වෙනත් ලොකු ඉස්කෝලෙකට. එතන මුරකුටිය ළඟ එයා වාඩි වුණා. ගොඩක් මහන්සි වෙලා හිටිය **Guzz** ට ඉබේම නින්ද ගියා.



උදේම Guzz ට ශබ්දයක් ඇහිලා එක පාරටම ඇහැරුණා. එයාව වට කරගත්ත චූටි ළමයින් පිරිසක් එයාගේ කන් වලින්, කකුල් වලින් අදිමින් හා ඇඟ අතගාමින් Guzz ව හුරතල් කරමින් සිටියා. කලින් ගිය ඉස්කෝලේ හිටියේ පිරිමි ළමයින් විතරක් වුණත් මේ ඉස්කෝලේ ඉන්නේ ගෑණු ළමයින් විතරයි. ඔවුන් දැක්ක Guzz ට එයා හිටිය ගෙදර බබාලා මතක් වුණා. එයාට බයක් වගේම සතුටකුත් දැනුණා.

ඒ අතරේ Guzz හිටිය තැනට ගුරුතුමියක් ආවා. ඇය තමයි 4-B ශ්‍රේණිය භාර සමන්මලී ගුරුතුමිය. ඇයගේ කරුණාවන්ත පෙනුම නිසාම Guzz ඇය ළඟට දුවගෙන ගියා. ගුරුතුමිය Guzz ව ඇයගේ පන්ති කාමරයට එක්කරගෙන

ගියා. Guzz ව දැකපු පන්තියේ ළමයි සතුටින් උඩ පැන්නා.



හැමෝම පාඩම් වැඩ ටිකකට අමතක කරලා Guzz ව හුරතල් කරන්න පටන් ගත්තා. විවේක කාලයේදි ළමයි හැමෝම ගෙනාපු කෑම ටික ටික එකතු කරලා රස කෑම ගොඩක් Guzz ට දුන්නා. මුලින් ටිකක් බය වුණත් හොඳටම බඩගින්නේ හිටපු Guzz කෑම ඔක්කොම කාලා සමන්මලී ගුරුතුමියගේ ඔඩොක්කුවට පැනලා නිදා ගත්තා.



ටික වෙලාවකින් අවදි වුණා Guzz මේස, පුටු අස්සෙන් පන්තිය වටේ රවුම් කිහිපයක් ගියා. ඒ වෙනකොට ළමයින්ගේ හා ගුරුතුමියගේ ආදරය සහ කරුණාවන්තකම නිසා එයාගේ බය හොඳටම අඩුවෙලා තිබුණේ. ටික ටික ඉස්කෝලේ ඉවර වෙන වෙලාව ළං වුණා.



"දැන් අපි මෙයාට මොනවද කරන්නේ? අද රෑ මෙයා කොහෙද ඉන්නේ? අපිට මෙයාව තනියම මෙහෙ දාලා යන්නත් බැනේ." හැමෝම දුකෙන් කිව්වා.



එක එක ළමයින් විවිධ යෝජනා ඉදිරිපත් කළා. ඒ වෙනකොටත් අයිතිකාරයා සොයා ගන්න පණිවිඩ යවලයි තිබුණේ. ඒ අතර පන්තියේ හිටපු තිනුලි, අයිතිකාරයා සොයා ගන්නකම් Guzz ව එයාගේ ගෙදර තියාගන්න කැමති වුණා. එදා හවස එයාගේ වාහනෙන් Guzz ව එයාගේ ගෙදර එක්කරගෙන ගියා. ගෙදර හැමෝම Guzz ව ආදරයෙන් හා පරිස්සමෙන් බලා ගත්තා.



මේ අතර සමන්මලී ගුරුතුමිය ඉක්මනින්ම Guzz ගේ අයිතිකරුවන් හමුවෙන්න කියලා දළදා මාළිගාවේ ප්‍රාර්ථනා බෝධියට පූජාවක් ද කළා.

හරි පුදුමයි! ඇය එතනින් එළියට එනකොටම **Guzz** අයිති අයගෙන් දුරකථන ඇමතුමක් ලැබුණා. එයාලා දවස් තුනක් තිස්සේ **Guzz** ව හැමතැනම හොයලා. **Guzz** නැති නිසා ගොඩක් දුකින් ඉඳලා තියෙන්නේ. ඒ අතරේ වෙන පන්තියක හිටිය සතිනි යාළුවගෙන් ලැබුණ ආරංචියක් තමයි ගුරුතුමියට කතා කරලා තිබුණේ **Guzz** ඉන්නවා කියලා දැනගෙන එයාලා ගොඩක් සතුටු වුණා.

**Guzz** අයිති අය එදා හවසම ඉස්කෝලෙට ආවා ගුරුතුමිය, තිනුලි හා අනෙක් ළමයින් **Guzz** ව ඔවුන්ට දුන්නා. ගෙදර අය දැක්ක **Guzz** ට ගොඩක් සතුටු හිතුණා. එයා ගෙදර අය ළඟට දුවගෙන ගියා.

**Guzz** යන එක ගැන ළමයින්ට දුක හිතුණත් එයාගේ ගෙදර අය හම්බවුණ එක ගැන ගොඩක් සතුටු වුණා. ගුරුතුමිය එයාලට කියලා දුන්න සතුන්ට කරුණාව දැක්වීම, හිංසා නොකිරීම, කරදරයකදී පිහිට වීමෙ වගේම කොතරම් ආසා වුණත් තමන්ට අයිති නැති දේ ලබා නොගැනීම වගේ හොඳ පුරුදු ගොඩක් එයාලට අත්හදා බලන්න පුලුවන් වුණා.

**Guzz**ටත් ළමයින් හා ගුරුතුමිය දාලා යන එක ගැන දුක හිතුණා.

"ආයේ නම් මම මේ වගේ හිතුවක්කාර වැඩ කරන්නේ නෑ. ඒත් මම එහෙම කළේ නැත්නම් මේ වගේ කරුණාවන්ත පිරිසක් හම්බ වෙන්නේ නෑනේ. මගේ වාසනාවට තමයි අන්තිමට මම මෙතනට ආවේ."



**Guzz** තනියම හිතුවා. ඊට පස්සේ **Guzz** එයාගේ වලිගය වනලා ඍඳාව් ඍඳාව් කියලා හැමෝටම ස්තූති කරලා එයාගේ ගෙදර අයත් එක්ක සතුටින් ගෙදර ගියා.

## නිමි.

*පසු සටහන -*

බැලූ බැල්මට මේක පුදුම කතාවක් කියලා හිතුනට මේක ඇත්තටම අපේ පන්තියේ වුණ ඇත්ත සිදුවීමක්. අදටත් **Guzz** ගේ ගෙදර අය එයාගේ වීඩියෝ, පින්තූර අපට එවනවා. අපිත් අපේ පන්තියේ වීඩියෝ එයාලට යවනවා. ඒවා දකිනකොට **Guzz** ඔළුව හරව හරව ඒවා දිහා බලනවා කියලා **Guzz** ගේ ගෙදර අය අපට කියනවා.

# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම, ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පරියේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්මන් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

**2023.11.01**